# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
# Assignment for Vacation -2020
## සිංහල

නම / අංකය ............................................. 13 ශ්‍රේණිය

01 වන කොටසේ 1වන ප්‍රශ්නයද, 02 වන කොටසේ 2,3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**<u>01 කොටස</u>**

01). එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන පිළිතුරු තෝරන්න.
එහි අංකය වරහන තුළ ලියන්න.

1.1)මූර්ධජ අක්ෂර පමණක් ඇතුළත් වරනය තෝරන්න.

1. ක,ච,ට.ත,ප
2. ප,ඵ,බ,භ,ම
3. ට,ඨ,ඩ,ඪ,ණ
4. ච,ඡ,ජ,ඣ ,ඤ
5. ත,ථ,ද,ධ,න (.......)

1.2)නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. ධාර්මිෂ්ඨ , සංස්කරණ , ව්‍යංග්‍යාර්ථ , ප්‍රත්‍යාවලෝකන
2. ධර්මිෂ්ඨ , සංස්කරණ , ව්‍යංග්‍යාර්ථ , ප්‍රත්‍යවලෝකන
3. ධර්මිෂ්ඨ , සංස්කරණ , ව්‍යාංග්‍යාර්ථ , ප්‍රත්‍යාවලෝකන
4. ධාර්මිෂ්ඨ , සංස්කරන , ව්‍යංග්‍යාර්ථ , ප්‍රත්‍යවලෝකන
5. ධර්මිෂ්ඨ , සංස්කරන , ව්‍යංග්‍යාර්ථ , ප්‍රත්‍යාවලෝකන (.......)

1.3)අකාරාදි පිළිවෙල අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. හිඟුරල, වම්බටු, පතෝළ, මැකරල්
2. අර්ථාපල්, සාරණ , පුහුල්, නිවිති
3. කොහිල, තලනබටු, නෝකෝල්, මල්ගෝවා
4. අවර මැ, දඹල, කරවිල, දෙල්
5. බණ්ඩක්කා , කැරට්, වැටකොලු,මඤ්ඤක්කා (.......)

1.4)පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න

1. ‘ශ’ යනු මූර්ධජ අක්ෂරයකි.
2. ‘ඨ’ අක්ෂරයේ පිල්ලම වනුයේ පාපිල්ලය.
3. ‘කෞ’ අක්ෂරයේ දැක්වෙන සංකේතයවන්නේ ගැටය සහිත ඇලපිල්ලයි.
4. ‘ෆ’ ඌෂ්ම අක්ෂරයක් වේ.
5. ‘ඣ’ නාසික්‍ය අක්ෂරයක් වේ. (......)

1.5)එකිනෙකට අනුරූප වන සේ වචන යෙදී ඇති වරණය තෝරන්න.

1. දළදා මැදුර, ස්වභාව ධර්මය, ධර්මද්වීපය, සඳ මඩල
2. බෞද්ධ දරුවා, සඳ මණ්ඩලය, සාහිත්‍ය ගත, ඖෂධ උයන
3. ප්‍රදීප එළිය, බස් ඥානය, සඳුන් අරන, ධර්ම පහන
4. ධර්ම දිවයින, කොවුල් කූජනය, ප්‍රේම පහන, සඳුන් රුක
5. නීල නේත්‍ර, මැදි විද්‍යාලය, නිර්වද්‍ය පිළිතුර, විද්‍යා දැනුම (.....)

1.6)තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. ධර්ම, රුක, මේස, ප්‍රදීප
2. භවය, මෘග, බස, ගජ
3. වර්ෂා, අභිධර්මය, සිසිල, අක්ෂි
4. දිව්‍ය, මනුෂ්‍ය, පුවත්, ප්‍රඥයාව
5. ප්‍රදීපය, පාඨශාලා, ප්‍රාතිහාරය, ප්‍රභාව (......)

1.7)තත්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. අරුත්, දහම්, පැදකුණු, මිනිස්
2. ධර්ම, මිනිස්, දක්ෂණ, පූර්ව
3. ගම්භීර, ත්‍රිපිටක, පිළිසකර, ගාන්ධර්ව
4. අභිෂේක, ගජ, සුගන්ධ, වැසිසමය
5. අහස්යානය, පිරිත් දෙසුම, බුද්ධරශ්මිය, රාජාඥාව (......)

1.8)කර්ම, සම්බන්ධ, අවධි, සම්ප්‍රදාන යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.

1. වැඩකරු, බිගුනද, මිහිඳුම්, පින්බත්
2. දෙව්දත්, පරපටු, සොරබිය, කිරිබත්
3. සොරබිය, පරවැඩ, රන්කම්, කම්කරු
4. බවදුක, රජපිරිස්, දඩයම්කරු, අහස්වැසි
5. වේපස්, සෙල්පිළිම, තැඹිලිතෙල්, ඇත්දළ (.....)

1.9)කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ලියවිලි, හැඩිලි, මැරීම්, නැටුම්
2. හඩන්නා, නටන්නා, දුවන්නා, බලන්නා
3. ගයන්නී, දුවන්නී. වදින්න, හඩන්නී
4. පැනිලි, පෙවිලි, කැවිලි, දිවිලි
5. නැටුම්, ගැයුම්, ලියුම්, වැයුම් (......)

1.10)පහත සඳහන් උද්ධෘත තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

I. ඇළෙන් වතුර **ගෙන** වගා බිම් සරුසාර කරගත්තතේය.
II. **වඩිනු මැනවි** පුදසුන මතට දෙවිදුනේ.
III. ලෙඩ **සුවවූවහොත්** විභාගයට ඉදිරිපත් වනු ඇත.
IV. දරුවන් ලවා පොළව **කොටවන්නාය.**

1. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
2. ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා,විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
4. විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
5. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා (......)

1.11)තත්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ලාවණ්‍යා, සාහිත්‍ය, මාධූර්‍ය, සාමාර්ථ්‍ය
2. පොඩිති, කැටිති, බටිති, බදිති
3. දෛනික, ලෞකික, නෛතික, ශාරීරික
4. උදාරත්ව, විශාලත්ව, තත්ත්ව, සුන්දරත්ව
5. දැහැමි, නැකති, දිගැසි, නැවි (......)

1.12)උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. පරාජය, පරාභව, පරාධීන, පරාවර්තනය
2. අපකීර්තිය, අපචාර,අපවාදය, අපහාස
3. විකෘතිය, විගමනය, විජිතය, විග්‍රහය
4. අනුග්‍රහය, අනුක්‍රමබිය, අනුකූල, අනුකරණය
5. ප්‍රතිකර්ම, ප්‍රතිගමනය, ප්‍රතිඥාව, ප්‍රතිරාවය (......)

1.13)නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. කොළ, බොල, එම්බා, තොමෝ
2. විනා, මිස, තුරු, පිණිස
3. වහා, නොලසා, ඉදුරා, කොදුරා
4. ඔහේ, අහෝ, අපොයි, අනේ
5. ඉතින්, ඉක්බිති, නිති, පසුව (......)

1.14)"අධ්‍යාපන **අමාත්‍යාංශය** පාසල් සිසුන්ගේ **සෞන්දර්යාය** කලා හැකියාවන් ඔප් නැංවීමට **සියපත** නම් වැඩසටහක් ආරම්භ කරන ලදී" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් මුද්‍රිත පද අයත්වන්නේ කවර ව්‍යාකරණ අංගයකට ද?

1. සමාස, තද්ධිත, සන්ධි
2. සන්ධි, සමාස, තද්ධිත
3. තද්ධිත, සමාස, සන්ධි
4. සන්ධි, තද්ධිත, සමාස
5. සමාස, සන්ධි, තද්ධිත (.....)

1.15)සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියාරූප සහිත වරණය තෝරන්න.

1. සරසන්න, ඇවිද ඇවිද, දිව්වේය, නැගුණෝය
2. නටන්නිය, නටනලද්දීය, ගයන්නීය, ගැයුවාය
3. වැටුණොත්, දිව්වොත්, ගැහුවොත්, කිව්වෝය
4. නටමින්, දුවමින්, ලියන්නීය, බලන්නීය
5. එන්න, යන්න, දුවන්න, ලියන්න (.....)

1.16)සමාස නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. කළුකොඩිය, අනුවන, දැත, දුසිරිත
2. පින්බත්, දෙව්දත්, සොරබිය, රජපිරිස්
3. මලවි, නාමෙනවිය, දසබල, තිනෙත්
4. අඹුසැමි, ගත්කුරු, අගුණ, සුදුඇතා
5. ගුත්තිලඇදුර, තලතෙල්, අත්කම් (.....)

1.17)එකම වර්ගයට අයත් පද අන්තර්ගත වරණය තෝරන්න.

1. බුදුකුරු, පිළිතුරු, පිනැති, පඬිතුමා
2. මිහින්තලය, තම්පලා, ගංවතුර, කොළොම්පුර
3. කටුවල, වියවුල්, ගිනියම්, දෙවුර
4. දඬයම්, අත්කම්, කම්මල, ගිනියම්
5. වටොර, මැත, මහෙසුරු, රුපුනොද (......)

1.18)ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

1. උදුල්, අබිමන්, නිමල්, සතුට
2. භික්ෂූන්, කවීන්, කිවිදියක, කම්කරුවකු
3. දඬයම්, දූප්පත්, මිහිදුම්, නිරවුල්
4. රකියි, වැටෙයි, පැසෙයි, බැබළෙයි
5. වදුරෙක්, වෙයෙක්, උකුස්සෙක්, කුකුළෙක් (......)

1.19)ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

1. ගුරුවරයෙක් හා ළමයෙක් විදුහල්පති හමුවෙයි.
2. ගංගාවක් සොබා දහම අලංකාර කරතී'යි කවියෝ කියති.
3. ඇතැම් රීතිහු වෙනස් වී ඇත.
4. නිළියන් දිනපතා ම රංගන අභ්‍යාසවල යෙදීම මැනවි.
5. සියලු සාමාජිකයන් මේ නිවේදනය පිළිගනිත්වා. (......)

1.20)ලේඛන ව්‍යවහාරයට වඩාත්ම සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. අපි සමග උරණ නොවන්න.
2. ප්‍රමාද වුයේ මොකද ?
3. අපි වරප්‍රසාද ලබා තිබේ ද?
4. මා ගී ගයනු ඔබ අසා තිබේ ද?
5. අපි හැමදා අවංක වීම යෙහෙකි. (......)

## 02 කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(02). අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

යුරෝපානු ශිෂ්ටාචාරයන්හි මෙන්ම ක්‍රි:පූ: පළමු වර්ෂ සහස්‍රකයේදී ආසියාවේ පහළ වූ හින්දු, බෞද්ධ, පර්සියානු සොරාෂ්ට්‍ර ශිෂ්ටාචාරයන් විසින් ද යුද නීතියට අනුව ක්‍රියා කර ඇති බවට පුරාවෘත්ත සාක්ෂි එමටය. උදාහරණ වශයෙන් මහා භාරතයේ එන "මනු" පිළිබඳ වෘතාන්තයට අනුව යුද්ධයේදී භේවායෙකු විසින් නොකළ යුතු දෑ යැයි සඳහන් කළ දේ නූතන යුගයට ද අදාළය. ඔහු දක්වන ආකාරයට භේවායෙකු විසින් තමාට යටත්වන්නාවූ හෝ අබ්බගාත වූ සතුරෙකු ඝාතනය නොකළ යුතුය. තුවාලකරුවන් සුවපත් කිරීමෙන් පසුව තමන්ගේ රටට යැවිය යුතුය. තවද මහා භාරතය දක්වන අන්දමට ඇතැම් ආයුධ භාවිතය ද තහනම්ය. උදාහරණයක් වශයෙන් ඇවුළුම් කටු හෝ විෂ පෙවූ ආයුධ භාවිතය තහනම්ය. ගිනි ඇවිලූ හීයෙන් විදීම ද තහනම්ය. යුද්ධය පිළිබඳව ඉන්දියානු රජුන් පිළිපැදි නීතිවලට හොඳම උදාරණයකි.මෞර්ය අදිරාජ්‍යයේ අශෝක රජු පැනවූ නීතියකින් ගෙනහැර දැක්විය හැක. ධර්මාශෝක රජුගේ එක් විධානයක් වූයේ යුද්ධයේදී තුවාලවූවන්ටත් ඔවුන්ට සාත්තු සප්පායම් කරන ආගමික කන්‍යාසහෝදරියන්ටත් ගරු කළ යුතු බවයි.

ග්‍රීක ශිෂ්ඨාචාරය පැවති යුගයේදීත්, ඉලියඩ් හා හෝමර් දක්වන අන්දමට යුද්ධයේදී සාධාරනාත්මක නීති ඇතැම් විට ක්‍රියාත්මක විය. සමා ගිවිසුම් ඇති කිරීම මෙන්ම මිය ගිය සතුරාට වුවද ගෞරව දැක්වීම ග්‍රීක යුගයේදී යුද නීතියක් විය. ඒ නිසාම මහා ඇලෙක්සැන්ඩර් රජු පරාජිත වූවනට මානුශික ආකාරයෙන් සැලකූ අතර ඔහුගේ විරුද්ධවාදියා වූ මේරියස් රජ පවුලට හා සෙසු කාන්තාවන්ට ගෞරවයෙන් සැලකූ බවත් සඳහන්ය. එසේ වුවද පැරණි ග්‍රීකයේ පැවති යුද නීතියට අනුව පරාජිත හෝ අල්ලා ගනු ලැබූ සතුරා ජයග්‍රාහකයාගේ දේපළක් ලෙස සැලකූ හෙයින් ඔහුගේ මනාපය පරිදි එවැන්නෙකු වහලකු කිරීම හෝ ඝාතනය කිරීම සිදු කල හැක.

I. යුද්ධ නීතියට අනුව ක්‍රියා කල ශිෂ්ඨාචාරයන් මොනවාද ?
II. මහා භාරතයේ සඳහන් යුද නීති දෙකක් ලියන්න.
III. මහා භාරතයේ වූ තහනම් ආයුධ දෙකක් ලියන්න.
IV. ධර්මාශෝක රජුගේ විධානයන් මොනවාද ?
V. ග්‍රීක යුගයේදි යුද්ධ නීතිය පිළිබඳව අදහස් දැක්වූ දාර්ශනිකයන් දෙදෙනෙකු දක්වන්න.
VI. වහලකු බවට පත්වූයේ කවුරුන් ද? (ලකුණු 12)

ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලෝකයේ දුප්පත්ම ජනතාවගේ ජීවිත සුරක්ෂිතාව හා ජීවන මට්ටම පරිසරය සුරැකීම හා සම්බන්ධ ඇති බව පැහැදිලිය. පාරිසරික විද්‍යාඥයින් මුහුණ දෙන ඉතා වැදගත් ප්‍රශ්න අතුරෙන් එකක් වනුයේ පෘථිවියේ ස්වාභාවික සම්පත් සීමා තුළ මානව සුභසාධනය වැඩිදියුණු කරන්නේ කෙසේද යන්නයි.මෙම උභතෝකොටික පැනයට විසඳුම විය හැක්කේ තිරසර සංවර්ධනයයි. තිරසර සංවර්ධනය යන යෙදුම හා අදහස ජනප්‍රිය වූයේ පරිසරය හා සඡවර්ධනය පිළිබඳ ජගත් කොමිසම විසින් 1987 දී නිකුත් කළ අපේ පොදු අනාගතය නම් වාර්තාවක් සමගය. එකී වාර්තාවේ තිරසාර සංවර්ධනය යන්න පැහැදිලි කර තිබුණේ අනාගත පරම්පරාවන්හි අවශ්‍යතාව ඉටුකර ගැනීමේ හැකියාවට අවහිර නොකරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම ලෙසය.

අප වෙනත් ලෙසකින් එයට අර්ථ දැක්වුවහොත් සංවර්ධනය යනු ජනතාවගේ ජීවිත උසස් මට්ටමකටය ගෙන ඒමටය. ඒ අනුව තිරසර සංවර්ධනය යනු වසර කිහිපයක් නොව පරම්පරා ගණනාවක් පවතින පරිදි හා ගැළපෙන පරිදි මිනිසාගේ ජීවන මට්ටමේ ප්‍රගතියක් ඇති කිරීමය. එය අවංක ලෙසින්ම සිදු වේ නම් තිරසර සංවර්ධනයේ වාසි සමාජයේ වරප්‍රසාද ලබන කුඩා කණ්ඩායමට නොව සියලුම මිනිසුන්ට ලැබිය යුතුය. බොහෝ ආර්ථික විද්‍යාඥයින්ට අනුව ඉතා දියුණු හා ඵලදායි සමාජයකට දිගුකාලීන පරිණාමයන් මෙන්ම ජනතාවගෙන් වැඩි කොටසක් සංවර්ධනය කරනු සඳහා සම්පත් ලබාදීම ද කළ හැකි එකම මාර්ගය ආර්ථික වර්ධනයයි.

(ලකුණු 15)

(03). දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මකව රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. මත්ද්‍රව්‍ය හා නූතන තරුණ පරපුරේ අනාගතය.
2. වසංගත පැතිරී යැම හා ඒවාට මුහුණ දීම.
3. පාරම්පරික උරුමයන් හා ඉපැරණි සංස්කෘතිය.
4. දේශීය වශයෙන් සංවර්ධනය කරා යෑමේ වැදගත්කම.
5. භාශාව, සාහිත්‍යය හා ජනමාධ්‍ය නිසිලෙස හැසිරවීම.

(04). අ). පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදහස් කොට ලියන්න.

1. උගතුන් රට අතහැරගියහොත් රටට මහත් පාඩුවක් වනු නියතය.
2. කාන්තාවෝ නිර්භයව, අවංකව සේවය කිරීමට කැදවීම මැනවි.
3. සතුරෝ සටනින් පැරදුණ හ යි සිතූ සේනාවෝ පලා ගියහ.
4. ශක්‍රයා හෙවත් සහසැස්හු දෙවියන් පිරිවරා සිටියි.

5. සභාපතිවරයෙක් සහන ආධාර බෙදීමට පැමිණ ඇත.

ඉ). නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

1. දුම්රිය (සේවකයන්/ සේවකයෝ) වැඩ වර්ජනය කරතියි (මගීහු/ මගීන්) සැක කළහ.
2. (කුමාරතුංගයන්/ කුමාරතුංගයෝ) ලියූ ව්‍යාකරණ විවරණ වර්තමාන(පාඨකයෝ/ පාඨකයන්) කියවති.
3. (ශ්‍රී ලංකිකයෝ/ ශ්‍රී ලංකිකයන්) සියලු දෙනා (සිංහලයන්/ සිංහලයෝ) නොවෙති.
4. (ගායකයන්/ ගායකයෝ) බොහෝ (දෙනෙක්/ දෙනෙකු) රාගධාරී සංගීතය ප්‍රිය කරති.
5. දරුවන්ගේ (දෙමාපියෝ/ දෙමාපියන්) පොත් කියවන්නේ නම් (දරුවෝ/ දරුවන්) ද පොත් කියවති.

(05). පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

1. හින්දුහු **පැණිබත්** සමග කසපැන් **පූජාසනය** මත තබා දෙවියන්ට පුද පූජාසනය මත තබා **දෙවියන්ට** පුද පූජා පවත්වති.( පැණිබත් - සමාස, පූජාසනය- සන්ධි, දෙවියන්ට- විභක්ති)
2. **සිගිති** දැරිය ඇඳුම **පුරාම** මඩ තවරා ගෙන **නැටුම්** නටයි.(සිගිති-තද්ධිත, ම-නිපාත,නැටුම්-කෘදන්ත)
3. ඔහු ගමට **යද්දි සෙමෙන්** වැස්ස **වැටෙමින්** තිබුණි.(යද්දි-ක්‍රියා,සෙමෙන්-විශේෂණ,වැටෙමින්-ක්‍රියා)
4. **බටහිර** අහස හිරු බැසයන **තුරු නැණැති** දනන්,(බටහිර-සමාස,තුරු-නිපාත,නැණැති-සන්ධි)
5. සොරු **රන්රිදී, මිණිබරණ** ගෙන **ප්‍රාකාරයෙන්** ගියහ.(රන්රිදී-සමාස,මිණිබරණ-සන්ධි,ප්‍රාකාරයෙන්-විභක්ති)

(06). අ). පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

1. ඇයගේ චරිතය අන් අයට ________ විය.
2. ________ ලෙස ජීවිතයට මුහුණ දුන් ඈ දිරිය කාන්තාවක් වූවාය.
3. ශ්‍රී රාහුල හිමියෝ ________ යුත් ග්‍රන්ථ ලොවට දායාද කළහ.
4. ________ තීරණ ගත් රාජ්‍ය නායකයා ජනතාව බේරාගත්තේය.
5. හෙදියන් තම අයිතීන් දිනාගැනීමට ________ කරනු ඇත.

(පාණ්ඩිත්‍යවයෙන්/ ආදර්ශවත්/ උද්ඝෝෂයි/ දූරදර්ශී/ බුද්ධිමත්) (ලකුණු 03)

ආ). පහත දැක්වෙන පද සන්ධි කර ලියන්න.

1. ගිරි + අග
2. ජාති + අනුරාගය
3. බුද්ධි + ඉන්ද්‍රිය
4. පින් + ඇති
5. වීර + උදාර
6. කැට + කම්

ඉ). තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්තිය නම් කරන්න.

1. **ඉරෙන්** හඳෙන් එළිය අරන් ඇළෙන් දොළෙන් සිසිල අරන් **අපට** හැදුණු ......
2. බුදුනේ **බුදුපියාණනේ මනුසත් දෙරණට** පුනරාගමනය කළ මැනවි.
3. දග නෑ ඒ වගේ **කිරිදරුවන් මගේ**..... (ලකුණු 03)

ඊ). අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

1. සමාජික සාමාජිකවන් අද දින රැස්වීම ප ව 3 30ට රුැස්වීම අවසන් කරන බව දන්වමි.
2. මාගේ දෙමාපියන් හට කුමක් සිදුවී දැයි අසමින් ඔ හඩා වැටුනාය.
3. සසර වසන තුරු නිවන් දකින තුරු යන ගීතය ඔහු සෙමෙන් මිමිණුවේය.

(ලකුණු 03)

උ). පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනය හරවා ලියන්න.

1. මම මාගේ විෂය නිර්දේශය ආවරණය කරමි යි ගුරුතුමා පැවසුවේය.
2. තම තමන්ගේ වගකීම හා යුතුකම ඉටුකරන ලෙස ඇමතිතුමිය ඉල්ලා සිටියාය.
3. ෛවෙරසය ව්‍යාප්ත වීම වළක්වා ගැනීමට නිවසේ රැදී සිටින ලෙස සියලු දෙනාගෙන් ෛවෙද්‍යවරයා ඉල්ලීය. (ලකුණු 03)

(07). පහත සදහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

20 වැනි සියවස තුළදී **ගෝලීය** මුහුදු මට්ටම සෙ.මි. 10-20ත් අතර ප්‍රමාණයකින් ඉහළ යාම **ඇස්තමේන්තු** කොට තිබුණද එම ප්‍රමාණයේ ත්වරණයවීමකට සාක්ෂි නොවීය. යුරෝපයේ තෝරා ගත් ස්ථාන කිහිපයකට **සාපේක්ෂ** මුහුදු මට්ටම **උදම්** මාන මිනුම් ඇසුරෙන් පරීක්ෂාකිරීමේදී හෙල්සින්කි හැරුණු විට අනෙක් ප්‍රදේශයන්හි සාපේක්ෂ මුහුදු මට්ටමේ ඉහළයාමක් පෙන්වයි. සෑම තනැකම මෙන් මුහුදු මට්ටමේ ඉහළ යාම්, ගෝලීය, මාධ්‍ය ඉහළ මට්ටම් තුළ පිහිටා ඇත. මෙම දත්ත වලින් පැහැදිලි වනුයේ **අනාගත** මුහුදු මට්ටම හා දැනට ඇති **නිරීක්ෂණ විශ්ලේෂණය** කිරීමේදී සාධක විශාල සංඛාවක් සැලකිල්ලට ගත යුතු බවයි.

1) ඡේදයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත වචන අකාරකදියේ පිළිවෙළට ලියන්න.
2) පරීක්ෂා, ඇසුරින්, හැරුණු යන වචනවල ඇති පිලි වෙන ම ලියන්න.
3) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
   #රකාරාංශය හා තාලුජ අක්ෂරයක් සහිත වචනයක්
   #නාසික්‍ය අක්ෂර දෙකක් ඇතුළත් වචනයක්
   #ඝෝෂ, කණ්ඨජ, ව්‍යංජන අක්ෂරයක් සහිත වචනයක්
4) පූර්ව ක්‍රියා, අවසන ක්‍රියාවක් ලියන්න.
5) නිපාත පද තුනක් ලියන්න.

(08). පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

I. මිශ්‍ර ක්‍රියා
II. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
III. අන්‍යාර්ථ සමාස
IV. අසම්භාව්‍ය ක්‍රියා
V. උක්ත අනුක්ත පද